උ. ප. රා. සේ.කො.ස චක්‍ර ලේඛ අංක : 16 / 2019

මගේ අංක NP/07/10/01/127
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
යාපනය.
09.05.2019.

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරවර ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත.

# උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය – 2019

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2019 ජූලයි මස** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **10.06.2019** වේ.

**02. සේවා කොන්දේසි :-**

02.1 **2013.04.02** වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරට අදාළ සේවා ව්‍යවස්ථාව සංග්‍රහය හා බඳවා ගැනීමේ පරිපාටියේ නියම කරන ලද රෙගුලාසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** සහ **2013.07.03** වැනි දින දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගන්නා අපේක්ෂකයන් අදාල පළාත් රාජ්‍ය කළමනාකරණ තනතුරේ III වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසරක වැඩබැලීමේ පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගන්නා ලද දිනයේ සිට වසර 03 ක් ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වූ සේවයකි. එබැවින් මෙම තනතුරට පත් කරනු ලබන අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන නියෝගයට යටත් කරනු ලැබේ.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අපේක්ෂකයකු එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළ යුතුයි යන නියෝගය අනිවාර්ය නියෝගයකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දි නිකුත් කරණු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 05 ක් අවසන්වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරණු ලබයි. ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ල සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය. පත්කිරීමට නියමිත සංඛ්‍යාව **68** කි. සීමිත තරඟ විභාගයෙන් පූර්ණය කරනු ලබන නිලධාරී සංඛ්‍යාව **පවතින පුරප්පාඩුවලින් 30% ක්** වේ.

**03. වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර **MN-2-2016** ට අනුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු. 28,940 - 10 x 300/= - 11 x 350/= - 10 x 560/= - 10 x 660/= - රු 47,990 ක් වේ.** (රු. 29,840/= වැටුප් පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුයි) කෙසේ වුවද ඉහත චක්‍රලේඛයට අනුකූලව උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**04. සාමාන්‍ය සුදුසුකම් :-**

04.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2 අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික යෝග්‍යතාවයකින් හා මනා චරිතයකින් හෙබි පුද්ගලයකු විය යුතුය.

04.3 මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර කැඳවා ඇති සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු ය

04.4 සීමිත තරඟ විභාගයක් මගින් බඳවා ගන්නා විට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**05 අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-**

**05.1 අධ්‍යාපන සුදුසුකම් :-**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන සමාර්ථයන් දෙකක් (02) ඇතුළුව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/අංක ගණිතය/ශුද්ධ ගණිතය /මූලික ගණිතය/වානිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත්වී තිබීම.

**05.2 අනෙක් සුදුසුකම් :-**

(අ) උතුරු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ, එම තනතුරුවල සේවය ස්ථිර කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංකඃ 03/2016 ප්‍රකාර PL 1- 2016, PL 2 -2016, PL 3 – 2016, MN 01-2016 යන වැටුප් කේත යටතේ වැටුප් ලබන නිලධරයන් විය යුතුය.

(ආ) නියමිත දිනට පෙර උතුරු පළාත් රාජ්‍ය සේවයේ අවම වශයෙන් වසර 05 ක අඛණ්ඩව හා සතුටුදායක සේවා කාලයක් ස්ථිරව සේවය කර තිබිය යුතු අතර එය ආයතන ප්‍රධානියා විසින් සනාථ කළ යුතුයි.

**සටහන :**

යම් කිසි තනතුරකට ස්ථිරව පත් කිරීමට ප්‍රථම සේවය කර ඇති හෝ යම් කිසි තනතුරකට අදාලව ස්ථිර වශයෙන් පත් කිරීමේ කොන්දේසිය යටතේ සේවය කර ඇති හෝ පුහුණුවක් ලැබීමේ කාල සීමාවක් ලෙස ඉහත 05.2 (ආ) හි සඳහන් සුදුසුකම් ලැබීමට අවුරුදු පහක කාලසීමාවක් ලෙස ගණනය කරනු ලබන්නේ නැත. කිසියම් තනතුරකට ස්ථිර පත්වීමක් ලබා දීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම් සේවා පදනම මත ඉහත සඳහන් 05.2 (ආ) හි සඳහන් කර ඇති සුදුසුකම් ලබා ගැනීමට එය අවුරුදු පහක කාලසීමාවක් ලෙස ගණනය කරනු නොලැබේ.

**සැලකිය යුතුයි :-**

**සියලුම අයදුම්කරුවන් තනතුරට අදාළ සුදුසුකම් සියල්ල 2019.06.10 වන දිනට හෝ ඊට ප්‍රථම පූර්ණය කර තිබිය යුතුයි.**

**06 බඳවා ගැනීමේ පරිපාටිය :-**

06.1 ලිඛිත පරීක්ෂණයකින් හා කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දි බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය පරිදි බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දි පරීක්ෂා කරනු ලබන අතර ඒ සඳහා ලකුණු ප්‍රදානය කරන්නේ නැත. අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ.

06.2 ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අපේක්ෂකයින්ගෙන් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ මුලු ලකුණු සංඛ්‍යා අනුපිළිවෙල පරිදි පත්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ

06.3 රාජ්‍ය කළමනාකරණ සහකාර III වන ශ්‍රේණියේ තනතුර සඳහා පවතින පුරප්පාඩු වලින් 30% ක් සීමිත තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අපෙක්ෂකයන්ගෙන් පුරවනු ලැබේ.

06.4 පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට තුනක් (03%) ආබාධිතයන් සඳහා වෙන් කරනු ලැබේ. තෝරා ගනු ලබන අපේක්ෂකයන් පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට ලිඛිත විභාගයේ ප්‍රශ්නපත්‍ර සියල්ලටම අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුයි. එමෙන්ම සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 50% ක් ලබාගත යුතුයි. පත්වීම සඳහා තෝරා ගන්නා අපේක්ෂකයෙක් තම ආබාධිත තත්ත්වය අදාල තනතුරේ සේවය කිරීමට කිසිදු බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය වාර්තාවක් මගින් සනාථ කළ යුතුයි

**සටහන :**

අපේක්ෂකයා ආබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානය මගින් විධිමත් පරිදි අයදුම් කරන බවට අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර ආබාධිතයකු නොවන අපේක්ෂකයෙක් තමා ආබාධිතයකු බවට සඳහන් නොකළ යුතුයි

## 07 විභාග ගාස්තු :-

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු. 500/= ක මුදලක් **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමාගේ අංක 3401** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. මොනව හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කරන්නේ නැත.

## 08 ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ (සෙමී 21 X සෙමී 29) ප්‍රමාණයේ කොළයක 1 සිට 4.5 දක්වා වූ කොටස් පළමුවැනි පිටුවේ, හා 4.6 සිට 7.0 දක්වා වූ කොටස් දෙවන පිටුවෙත්, අනෙක් කොටස් තුන්වන පිටුවෙත් ඇතුලත්වන පරිදි ඉල්ලුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර **10.06.2019** වැනි දිනට හෝ ඊට පෙර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත අංක 393/48, කොවිල් පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

08.2 ඉල්ලුම්පත්‍රය බහාලන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් කළමනාකාරණ සහකාර සේවයේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.

08.4 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට වත් කලින් ප්‍රවේශ පත්‍රය ලැබුණේ නැතිනම් ඒ බවට පහත සඳහන් විස්තර සහිතව **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කොවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය **021- 221 9939**, ෆැක්ස් අංකය **021- 221 9940**)

**සටහන:**

විස්තර ඇතුළත් ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල් ලිපිනය, ඉල්ලුම්පත්‍රයේ පිටපතක්, ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, සහතික කරන ලද විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ෆැක්ස් අංකය.

## 09 පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම:-

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. ඒ සඳහා පහත සඳහන් කුමක් හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුණුම් පත .

(11) වලංගු ශ්‍රීලංකා ගුවන් ගමන් බලපත්‍රයක්. (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියකියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් පනවන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත්විය යුතුය. එම රෙගුලාසිවලට පටහැනිව ක්‍රියා කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් පනවන දඬුවමකට යටත්විය යුතුය.

**10 අසත්‍ය තොරතුරු සඳහා දඩුවම් : -**

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රයේ තොරතුරු ඉදිරිපත් කරන විට ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුයි. විභාග රෙගුලාසිවලට අනුව යම්කිසි අපේක්ෂකයකු දැන දැනම අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වෙන විට හෝ පසුව, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ වැරදි තොරතුරක් සපයා ඇති බව හෝ කිසියම් කරුණක් වසන් කර ඇති බව අනාවරණය වුවහොත්, ඔහු /ඇය සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත.

**11 විභාග පරිපාටිය:-**

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් ප්‍රශ්නපත්‍ර ඇතුලත් වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍ය වලින් පවත්වනු ලැබේ අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව නොදෙනු ලැබේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01යි | 100 යි |
| 02 | කළමනාකරණ සහකාර සේවයේ භාෂණ හැකියාව සහ සුදුසුකම් හඳුනාගැනීමේ පරීක්ෂණය | පැය 02 1/2 යි | 100 යි |

**අභියෝග්‍යතාවය ඃ-**

මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේකෂකයකුගේ සංඛ්‍යානම හැකියාව, තාර්කාණුකුල ශක්තිය, සාමාන්‍ය බුද්ධිය යන කරුණු පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි.

**කළමනාකරණ සහකාර සේවයේ භාෂණ හැකියාව සහ සුදුසුකම් හඳුනාගැනීමේ පරීක්ෂණය ඃ-**

අපේක්ෂකයකුගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනා, ඉදිරිපත් කරන දත්තවලට අනුකූලව ලිපිය සකස් කිරීම, ඉදිරිපත් කරන ඡේද කෙටි කර ලිවීම, වාක්‍යවල අන්තර්ගතය තනි වාක්‍යයකින් ලිවීම, ඉදිරිපත් කර ඇති දත්ත උපයෝගි කරගෙන කෙටුම්පත් හා ප්‍රස්ථාර සකස් කිරීම, සරල ව්‍යාකරණ ක්‍රම භාවිතය, කාර්යාලයට අදාළ ලියකියවිලි පිළිබඳව කටයුතු කරන ආකාරය හා නිලධරයකු පියවර ගත යුතු විෂයයන් අඩංගු ලිපියක් සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳ රෙගුලසීන් හා මූලික නියෝග යන කරුණු කළමනාකරණ සහකාරුවකුගේ රාජකාරීන් සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම, ඇමතුම් දින පොත, වවුචර, චලන පත්‍රිකා පැමිණීමේ ලේඛනය දින මුද්‍රාව, මුද්‍රාව හා රබර් මුද්‍රාව, තැපැල් මල්ල හා එය භාවිතයේදී කාර්යාලය විසින් උපයෝගි කර ගන්නා ක්‍රම ගැන අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි

**සටහන :-**

මෙම පත්වීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්ණ පත්‍ර සියල්ලටම අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුවේ. සමස්ත ලකුණුවලින් අවම වශයෙන් ලකුණු 50% ක් ලබා ගත යුතුයි.

**12 විභාග ප්‍රතිඵල :-**

අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් **www.np.gov.lk** යන උතුරු පළාත් සභා අන්තර් ජාලයෙන් මුදා හරින අතර විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් සියලු දෙනාටම තැපැල් මගින් එවීමට කටයුතු කරනු ලැබේ.

**13** විභාගය පැවැත්වීම සඳහා නිශ්චිත නගර හා එම නගර සඳහා වූ අංක පහත් සඳහන් වේ

| **නගරය** | **නගර අංකය** |
|---|---|
| යාපනය | **01** |
| මන්නාරම | **02** |
| වවුනියාව | **03** |
| කිලිනොච්චිය | **04** |
| මුලතිව් | **05** |

එක් නගරයක් වෙනුවෙන් ලැබෙන අයදුම්පත්වල සංඛ්‍යාව අඩු වූ අවස්ථාවකදී ළඟම ඇති නගරයක විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

**14** මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමේ බලය **"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්** සතු වේ. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

***අ. සිවබාලසුන්දරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
**09.05.2019**